# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/ 164/2019 (PSC)

ආර්.එස්.එස්.එච්.එම්.එච්.ඩී.හේරත්,

**අභියාචක**

**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

දිනය :- **2025.04.24**

ඉදිරියේ දී :- විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)

ජේ.ජේ.රත්නසිරි (සාමාජික)

එස්.නන්දසේකරන් (සාමාජික)

පෙනී සිටීම :- අභියාචක සිටී,

අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක ආර්.ඒ.බී.රණසිංහ මහතා,

වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් එල්.එල්.ඩී.එස්.එරන්ද මහතා,

**<u>විනිසුරු කේ.ටී. චිත්‍රසිරි මැතිතුමා</u>**

## -නියෝගය-

මෙම අභියාචනය 2024.09.26 වෙනි දින විමසීමට ගත් අවස්ථාවේ දී අභියාචක වෙනුවෙන් ඔහුගේ දේශන වලින් අඩක් ඉදිරිපත් කරන ලදි. එකී දේශන පැහැදිලිව ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විමසීම අද දිනට නියම කරන ලදි. අනතුරුව දෙපාර්ශවයටම ඔවුනොවුන්ගේ කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන ලදි. ඒ අනුව එසේ ඉදිරිපත් කරන ලද කරුණු ද, ගොනුවේ ඇති ලේඛන යන්හි සඳහන් කරුණු ද, අදාළ අනිකුත් සියළුම කරුණුද සළකා බලන ලදි.

අභියාචක විසින් මෙම අභියාචනය ඉදිරිපත් කර ඇත්තේ 2019.09.26 වෙනි දින ඉදිරිපත් කරන ලද ලිපිය අනුවය. එමගින් ඔහු ඉදිරිපත් කර ඇත්තේ, අමාත්‍ය මණ්ඩලය විසින් කර ඇති නිර්දේශයක් අනුව ඔහුට හිමිවිය යුතු උසස්වීම ලබා දිය නොහැකි බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇති බවයි. එම තීරණයෙන් තෘප්තියට පත් නොවූ අභියාචක විසින් 2019.09.26 දිනැති මෙම ඉල්ලීම ඉදිරිපත් කර ඇත. ඔහුගේ එකී ඉල්ලීමෙහි කිසිදු ස්ථානයක කුමන සහනයක් ඔහු විසින් ඉල්ලා තිබේ දැයි පැහැදිලිව සඳහන් කර නැත. එහි අවසාන ජේදයෙහි ඔහු සඳහන් කර ඇත්තේ සාධාරණයක් ඉටුකර දෙන ලෙසයි.

කෙසේ වෙතත් මෙම විනිශ්චය අධිකාරයට නීතියෙන් බලය ලැබී ඇත්තේ කිසියම් පුද්ගලයෙකු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ පොලිස් කොමිෂන් සභාවේ තීරණයක් සම්බන්ධයෙන් මැදිහත්වීමෙන් පසුව, එම තීරණය ඉවත් කිරීමට, වෙනස් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියා මාර්ගයක් එම තීරණයට අදාළව ලබාදීම පිණිසය. අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය මගින් ඉල්ලා ඇත්තේ, අමාත්‍ය මණ්ඩලය විසින් අභියාචක සම්බන්ධයෙන් ලබා දී ඇති සහන ලබාදෙන ලෙසය. අභියාචක විසින් ඉදිරිපත් කර ඇති 2021.05.10 දිනැති ලිපිය මගින් ඔහුගේ අභියාචනය සංශෝධනය කර ඇතත්, එම සංශෝධිත අභියාචනාවේ දි වුවද ඔහු විසින් ඉල්ලා සිටිනු ලබන සහනය කුමක් ද යන්න පැහැදිලිව සඳහන් කර නැත. කෙසේ වෙතත් එම ලේඛනයේ ද සඳහන් කර ඇත්තේ, අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඔහුට ලැබී ඇති උසස්වීම ලබා දෙන ලෙසය.

ඉහත කී අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පත්කරන ලද අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ නිර්දේශය වන්නේ, අයදුම්කරුට සහකාර ප්‍රවාහන අධිකාරී තනතුර ලබා දීමට නිර්දේශ කරන බවයි. එකී අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී ඇත්තේ 2018.03.27 වෙනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දීය. එම තීරණය අනුව පත්කර ඇති අනු කමිටුවේ තීරණය, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති ඉහත කී 2021.05.10 දිනැති අභියාචනය සමඟ, ඇමුණුම් 07 වශයෙන් ඉදිරිපත් කර ඇත. එම ලේඛනයේ සඳහන් කමිටු නිර්දේශය වන්නේ අභියාචකට සහකාර ප්‍රවාහන අධිකාරී තනතුර ලබාදීම නිර්දේශ කරන බවයි.

අභියාචක, ඉහත කී සහකාර ප්‍රවාහන අධිකාරී තනතුරට කරන ලද ඉල්ලීම කුමක්දැයි ඔහුගෙන් ප්‍රශ්න කළද, එම ඉල්ලීම ඉදිරිපත් කිරීමට අභියාචක සමත් වූයේ නැත. මේ අවස්ථාවේ දි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙම අධිකාරය වෙත 2021.11.17 දිනැතිව එවන ලද නිරීක්ෂණ සටහන් වලට මෙම විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කරන ලදි. එකී නිරීක්ෂණ සටහන් වල 5(ii) ජේදයේ

සඳහන් කර ඇති පරිදි, අභියාචක විසින් 2010 වර්ෂයේ අයදුම්පතක් ඉදිරිපත් කර ඇත්තේ විමර්ශන නිලධාරී/පරීක්ෂක තනතුරට ය. එය එසේ වුවද, කමිටුව නිර්දේශ කර ඇත්තේ අභියාචක වෙත සහකාර ප්‍රවාහන අධිකාරී තනතුරක් ලබාදීම සඳහා ය.

මේ අනුව පැහැදිලිව පෙනී යන්නේ, අභියාචක විසින් අමාත්‍ය මණ්ඩල තීරණයක් මත ඔහුගේ උසස්වීම ලබාදෙන ලෙස ඉල්ලා සිටිය ද, ඒ සඳහා ඔහු විධිමත් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර නොමැති බවයි. එවැනි තත්ත්වයක් යටතේ අභියාචක විසින් ඉදිරිපත් කරන ලද කරුණු සළකා බලා, ඔහුගේ ඉල්ලීම සම්බන්ධයෙන් නිර්දේශයක් ඉදිරිපත් කිරීමට හැකියාවක් ලැබෙන්නේ නැත.

ඉහත කරුණු සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභා කරමි.

ඒ අනුව අභියාචනය නිශ්ප්‍රභා කරමි.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

(එස්.නන්දසේකරන්)
(සාමාජික)

ලලිතා/-